# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය! Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 13
NUMBER 05

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

AUGUST 10, 2010 අගෝස්තු මාසය (බුද්ධ වර්ෂ 2554 නිකිනි මාසය) http://www.lankaheritage.com/lankaviththi/




***මහනුවර ඇසළ පෙරහැරේ විදි සංචාරය පිණිස දන්ත ධාතූන් වහන්සේ දියවඩන නිළමෙතුමා විසින් දළදා මාළිගාවෙන් පිටතට වඩම්මවනු ලබන්නට ගෞරව පූර්වකව සූදානම් වන අයුරු.***

The **Sacred Tooth Relic of the Buddha** is ceremoniously removed from the **Temple of Tooth** in **Kandy**, Sri Lanka by **Diyawadana Nilame** (Temple's custodian) to be carried on the back of an adorned elephant - **Raja**. The procession including hundreds of elephants, acrobats, dancers and fire-throwers parade through hill capital Kandy's streets in the most glamorous and prestigious August pageant in Sri Lanka known as **the Kandy Perehera**.

( ***Photograph*** **- Wimal Ranjith Fernando -** ***Sri Lanka*** )

---

ගතින් යොදුන් දහසක් දුර වෙසෙමි අවර දෙස නැතිහුරු
සිතින් ඇසළ මස දැකගමි සෙංකඩගල ඇති විසිතුරු
නිතින් සරණ වන සතහට අඳුරු මකන ලෙස දිනිසුරු
බැතින් පුදමි සිරි දළදා වහන්සේට දිවි ඇතිතුරු

**Living thousands of miles far away in the unfamiliar, alien West**
**Yet I dream about festive splendour of Kandy in serene Esala August**
**The beaming Sun above dispels the darkness and protects all being**
**So does the sacred tooth-relic, I ever venerate in the highest esteem**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

# අපි කන හැටි ලිපා දනී!

**♦ සංජය විමලරත්න විසිනි**

**ප**සුගිය මාස කීපය මුළුල්ලේ අප වරින්වර ශ්‍රීලංකාවේ අපේ නෑයන්ට ද හිතමිතුරන්ට ද කතාකළ විට සාමාන්‍යයෙන් ගත් කටටම අසන පරිදි " කොහොමද සැප සනීප? " යනුවෙන් ඇසීමු. එයට බොහෝ විට ලැබුණු පිළිතුර වූයේ " මොන සැපක් ද පුතා.... අන්තිම දුකෙන් ඉන්නෙ" යනුවෙනි.

"දුකෙන්? මොකද දුකෙන් ඉන්නෙ. දැන් යුද්දෙත් ඉවරකොට? "

" යුද්දෙ ඉවර වුණු එක හැබෑව.... ඒකට අපි හමුදාවට රජයට පිං දෙනවා.... ඒ වුනාට මේ බඩු මිළ දරන්න බෑ.... මිනිස්සු කොහොමද ජීවත්වෙන්නෙ කියලා හිතාගන්න අමාරුයි.... ඔහේලා මෙහේ ආවොත් තේරෙයි මේ මං කියන දේ.... ලොකු ලොක්කන්ට ප්‍රශ්නයක් නෑ.... ඒ ගොල්ලන්ට කවදාවත් බඩු මිළ ප්‍රශ්නයක් නෙවෙයි නේ.... නමුත් සාමාන්‍ය මිනිස්සුන්ට මේ බර දරන්න බෑ....කොටින්ම අපි කන හැටි ලිපා දනී! එච්චරයි මට කියන්න තියෙන්නෙ....! "

මේ ලිපියේ මුල ලොකු අකුරෙන් දැක්වෙන ඉහතකී ශීර්ෂ පාඨය හෙවත් හෙඩිම අප තෝරා ගත්තේ ඒ දෙබසෙනි.

මේ තත්වය තුළ ලංකාවේ ජනතාවගේ දෛනික ජීවන වියදම පිළිබඳව හෙවත් කෑම බීම ඇතුළුව අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වල මිළ ඉහළ යනවාද? එසේ ඉහළ යනවා නම් ඒවාට හේතු මොනවාද? යන්න නියමාකාරයෙන් සොයා බැලිය යුතුයයි අපට සිතිණ. මෙහිදී ශ්‍රීලකාවේ සාමාන්‍ය ගෙවල්වල ගෘහණියන්, ලිපිකාරයින් ඇතුළු මධ්‍යම පන්තිකයන්, කම්කරුවන්, වෙළෙන්දන් සහ සතොස හා සමූපාකාර ආයතන වල පරීක්ෂක මට්ටමේ නිලධාරීන්ගෙන් ද විමසීම් කළෙමු. මේ ලිපිය සැකසෙන්නේ ඒ සොයාගත් විස්තර මතය. ඒ නිසා මේවා සත්‍ය නොවේයයි කියන්නට කාටවත් නොහැකි ය.

මධ්‍යම පන්තික ගෙවල්වල අය සාමාන්‍යයෙන් රැකියා පඩියෙන් මාසයක වියහියදම් පිරිමසා ගනිති. ඔවුනට අමතර ආදායම් මාර්ග නැත. ඒ නිසා ලැබෙන මුදල් වියදම් කරන්නේ ඉතා පරිස්සමිනි. ගෙදරට ගෙන එන හාල් ඇටේ, මිරිස් කරලේ, ලූනු ගෙඩියේ, කරවල කෑල්ලේ සිට සියළු කෑම් බීම් ආදියේ මිළ නැගීම සිදුවන වේගය ගැන හොඳ අවබෝධයක් මේ කාන්තාවන්ට ඇත. ඒ බොහෝ දෙනා මාසයේ සියළු වියදම් ලියා තබති. එක සතයකින් හෝ යමක මිළ වැඩිවුනා නම් ඒ අයට එය වහා දැනේ. ඉහළ මධ්‍යම පන්තියට හා ධනපති පන්තියට බඩු මිළ ප්‍රශ්නයක් නොවේ. ඒ බොහෝ අයට අමතර ආදායම් මාර්ග ඇත. ඔවුන්ට ටිකක් හෝ දැනෙන්නේ පිට රටින් ගෙන්වන අධි සුඛොපොභෝගී භාණ්ඩවල මිළ ඉහළ ගියොත් පමණය. එහෙත් ලංකාවේ ජනගහනයෙන් බහුතරය දිළිඳු සහ මධ්‍යම පන්තිකයින් වන බැවින් ජීවන වියදමෙන්, නැත්නම්, කෑම බීම මිළ ඉහළ යාමෙන් සැමදා පීඩා විඳින්නෝ ඔව්හු වෙති.

## යුද්ධය නිසා කළ ඉවසීම

යුද්ධය තිබුණු පසුගිය කාලයේ මානසික වශයෙන් හා ආර්ථික වශයෙන් අප රටේ ජනතාව වින්ද දුක අපට හොඳින් මතකය. එදා රටේ නායකයින්ද, දේශපාලනඥයින්ද රටේ ජනතාවගෙන් එක පැහැර ඉල්ලා සිටියේ මේ යුද්ධය ඉවරකරන්න අපට සහයෝගය දෙන්න. එහිදී සිදුවන හැම දුකක්ම, වේදනාවක්ම, බඩගින්නක්ම රට ජාතිය වෙනුවෙන් ඉවසාගෙන ඉන්න. ත්‍රස්තවාදය අවසන් කළාම අපි ජනතාවට සැම සහනයක්ම සළසනවා යන්නයි. එය දේශපාලකයින්ගේ මන්ත්‍රයක් බවට පත්විය. රජයේ මාධ්‍යවලින් ද ජනතාවට ඒත්තු ගැන් වූයේද ඒ කාරණම ය.

ඒ ඇසූ ජනතාවෝද හා... හූම්... නොකියා සියල්ල ඉවසා සිටියෝ ය. යුද්ධය ඉවරවී අවුරුද්දක් ගෙවීගියත් මිනිසුන් තවම පටි තදකරගත්ත ගමන් ය. එදා ඒ කී කිසිවක් දැන් රජයට ද, දේශපාලකයින්ට ද මතක නැත. කෑම බීම මිළ බලා සිටියදී ඉහළ යයි. එයට සැලකිය යුතු පිළිතුරක් රජයෙන් නොලැබේ. උතුරෙන් එළවළු, මාළු කොළඹට ටොන් ගණන් දැන් එනවා

**4 වන පිටුව බලන්න ➸**




ඔබේ මුදල් අදම යවන්න අදම ලබාගන්න

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3